**රට ගිනි කන්දක් උඩ**

2022 වසරේ විනාශයට මූලික වූ ගෝඨා පාලනය පරිදි ම 2023 විනාශයේ මූලිකයා වන්නේ රනිල් රාජපක්ෂ පාලනය බව පෙනේ. මේ වන විටත් රනිල් වික්‍රමසිංහ ඉදිරියට ගෙන යාමට උත්සාහ කරන පාලනය මගින් ඒ බව දකින්නට හැකි වේ. ගෝඨාභය සිදු කළ ආණ්ඩුකරණයේ වැරදි ඉතා ආඩම්බරයෙන් රනිල් වික්‍රමසිංහ සිදු කිරීම යි. ඔහු ඉදිරිපත් කළ මෙවර අය වැය තුළ සම්පූර්ණව කියා පාන්නේ නව ලිබරල්වාදී ආර්ථිකය නැවත වෙනත් මුහුණුවරකින් ඉදිරියට ගැනීමකි. එහි සමහර අංග ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පවා අතහැර දමා තිබෙන ඒවා ය. එහි සඳහන් කරන සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති සකසා ඒවාට ප්‍රමුඛත්වය දීම මගින් රට වැටී තිබෙන තීව්‍ර අර්බුදයෙන් ගොඩ ඒම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නව අංගයන් ය. ඒවා ඉතිහාසයේ අයි. එම්. එෆ්. එක විසින් යෝජනා කර නොතිබිණි. රනිල්ගේ අය වැය ඉදිරිපත් කිරීම තුළ සමාජ ආරක්ෂක වැඩ පිළිවෙළක් ගැන කෙටියෙන් සඳහන් කර තිබුණත් ඒ ගැන පැහැදිලි කිරීමක් දකින්නට නොහැකි විණ. ඔහු උජාරුවෙන් කියා පෑ මූල්‍ය අරමුදලේ ප්‍රතිපත්ති රාමුවේ ඇති ආර්ථික උපාංග දෙක වන්නේ රාජ්‍ය අංශයේ පුද්ගලීකරණය කිරීම සහ නිර්යාත ආදායම වර්ධනය කරන නව ආර්ථික උපාය මාර්ගයන් වේ. ඔහු මේ නිර්යාත සමාජ ආරක්ෂණ උපාය මාර්ගය විස්තර කිරීමෙන් වැලකී සිටියේ ය. ඔහු කියා පෑවේ අය බදු ප්‍රතිසංස්කරණය සහ අනෙකුත් ආර්ථික ප්‍රතිසංස්කරණ ප්‍රතිපත්ති ක්‍රියාවට නැගීම තුළින් දූනට උග්‍ර වෙමින් පවතින අර්බුදය තව තවත් තීව්‍ර වීමයි. දුර්වල මට්ටමකින් හෝ පවතින සමාජ ආරක්ෂණ යාන්ත්‍රනය විනාශ කිරීම ය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ බලධාරීන්ට වඩා ඔහු මූල්‍ය අරමුදල්කරණය වී තිබේ. ආර්ථිකය ගොඩ දැමීම කෙසේ වුවත් ආර්ථික වෘද්ධියත්, සමාජ සාමයත් යන දෙක ම මරණීය අනතුරකට ඇද දමා තිබේ. මේ මගින් 2023 දී උග්‍රවන සමාජ ව්‍යසනය අතිශය දරුණු වේ. මේ පාලනය හඳුන්වා දුන් ආර්ථික ප්‍රතිපත්ති මූලය වන්නේ මේ අර්බුදය නිර්මාණය කිරීමට හේතු වූ නව ලිබරල් දූෂිත ආර්ථික රාමුව කිසිදු සංශෝධනයකට බඳුන් නොකර නව ලිබරල්වාදී ලක්ෂණ සහ ආර්ථික දූෂණයේ අවකාශ තව තවත් ශක්තිමත් කරන ආර්ථික විග්‍රහයකි. මේ වන විටත් විද්‍යමාන වී ඇති පරිදි නව ලිබරල්වාදය යනු නාගරික මිථ්‍යාවකි. එය මනෝ රාජ්‍යයකි. අනාගතය සඳහා හොඳ ෆැන්ටසියක් බව යෝජනා වී ඇත. මූල්‍ය ධනපතීන් ඇතුලුව ප්‍රධාන ධනපති කොටස් සහ මේ නව ලිබරල් වැඩ පිළිවෙලේ නියමුවෝ ය. නිෂ්පාදනය , පාරිභෝජනය සහ පොහොසත් වීම ඔවුන්ගේ සටන් පාඨ වී තිබේ. රනිල් ක්‍රියාවට නගන්නේ මේ ආර්ථික වැඩ පිළිවෙල මගින් විදේශීය සහ දේශීය

ජාවාරම්කාර බලවේගවලට මග විවෘත කිරීම ය. ඔහුට අවශ්‍ය වන්නේ වාණිජ්‍ය ධනපති බලවේග ආරක්ෂා කර දුන් දුගී දුප්පත්කම සමාජගත කිරීම ය.

රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා මේ අර්බුදය ඩොලර් හිගවීමේ අර්බුදයක් බවට අර්ථ ගන්වන්නට උත්සාහ දරයි. මේ නිසා විදේශ විනිමය අර්බුදය කෙටි කාලීනව විසදා ගැනීමට හදිසි ක්‍රියාමාර්ග ගැනීම මගින් අර්බුදය තවත් උග්‍ර කරනු ඇත. මේ මගින් 2022 වසරේ ඉදිරියට පැමිණි අර්බුදයේ තවත් දිගුවක් වීම වැලැක්වීමට නොහැක. දැනට නිමා වෙමින් පවතින වසර 2022 ක තුල ඇති වූ අර්බුදය පෙර දකින්නට පොදු ජන පෙරමුණට නොහැකි වූවා සේ ඉදිරි ව්‍යසනය තේරුම් ගැනීමට ඔහුනට කිසිදු සංවේදී බවක් නැත. මෙම අර්බුදය නැවත ඉදිරියට ඇදීම තුළින් තියුණු දේශපාලන අර්බුදයකට මග සලකුණු කරනු ඇත. එය මැයි ජූනි, ජූලි, අරගලයකට වඩා වර්ධනය වනු ඇත. පසුගිය අරගලය ඇති වීමට තුඩු දුන් වාස්තවික සහ විෂය මූලික තත්ත්වයන්ම එසේම පවතින අතර , ඉදිරියේ දී එය තවත් උග්‍ර වනු ඇත. මේ පාලකයින් සිටින්නේ ගිනි කන්දක් උඩ බව ඔවුන් නොදනී. එය අළු යට ගින්නක් සේ නැවත මතුවීම වැලැක්වීමට නොහැක.

ඉදිරි අරගලය රාජ්‍ය බලය යොදවා මර්දනය කිරීමට ගන්නා උත්සාහය ඔවුන්ගේ මිනීවල ඔවුන් විසින්ම කපා ගැනීමක් වනු ඇත.

මහින්ද දේවගේ
ශ්‍රී ලංකාවේ සමාජවාදී පක්ෂය